IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2014/2015

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2017 මැයි)

## BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවනතා

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) **ප්‍රශ්න පහක් සඳහා (05)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුව පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01) (අ) "ගෝලීයකරණය සහ තොරතුරු තාක්ෂණය හේතුවෙන් කාලය සහ අවකාශය බොහෝ දුර සීමා කර ඇත. (Together globalization information and technology crush time and space)" උක්ත ප්‍රකාශය ඇසුරින් ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොළ තුල සිදුවන විප්ලවකාරී වෙනස් කම් කවරේදැයි සාකච්ඡා කරන්න.

(ආ) උක්ත ප්‍රකාශය ඇසුරින් අප රට තුල ක්‍රියාත්මක සම්ප්‍රදායික රැකියාවන් අභියෝගයට ලක්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02) (අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුන වැව නැමති ගම් ප්‍රදේශයේ උපත ලද සෙනෙහෙලතා අවුරුදු නවයක් වයසැති වන විට ඇයගේ මව අධික දරිද්‍රතාවය හේතුවෙන් විදේශ රැකියාවක් සඳහා පිටත්ව ගියාය. ඇයගේ සෙසු සහෝදරියන් බාල වියේදීම විවාහ වී නිවසින් බැහැරව ජීවත්වීම නිසා අනුරාධපුරයේ වෙළෙඳ ආයතනයක මුරකරු රැකියාවේ නිරත ඇයගේ පියා, ඔහුට ලද තොරතුරක් මත තම බාල දියණියගේ රැකවරණය සහ අධ්‍යාපනය ලබා දීමේ වගකීම භාරගත් කුරුණෑගල ප්‍රදේශයේ ධනවත් කාන්තාවකට භාරදුන්නාය. එහිදී ඇය පාසැලකට ඇතුලත් නොකෙරුන අතර මුලින් ගෙදර දොර සුළු වැඩපලට ඇය යෙදවූ අතර ක්‍රමයෙන් එම නිවසේ ළමයින් බලා ගැනීම, ඉවුම් පිහුම් කටයුතු, බල්ලන් නෑවීම මෙන්ම ලොකුනෝනා ලෙස හැඳින්වූ එම වැන්දඹු කාන්තාවගේ සිරුර සම්භාහනය කිරීම වැනි කටයුතු වෙනුවෙන් පාන්දර හතරේ සිට රාත්‍රී 11.00 දක්වා සේවය කිරීමට සිදුවිය. අවුරුදු දහතුන පිරෙන විට ඇය වැඩිවියට පත් වූ අතර කීප අවස්ථාවකදී හැර ඇයට තම පියා මුණ ගැසීමටද අවසර ලබා දී නැත. ඇයගේ ඉල්ලීම පරිදි ඇයට හිමි වැටුප බැංකුවේ තැන්පත් කරන බව පවසන ගෙහිමි කාන්තාව ගමන් වියදම් හැර කිසිදු මුදලක් පියාට ගෙවා නැත. වසර පහකට පසුව සිංහල අළුත් අවුරුද්ද වෙනුවෙන් තම පියා මුණගැසීමට අවශ්‍ය බව පැවසූ ඇය ඒ සඳහා තම වැටුප හා අවසරය ලබා දෙන ලෙස තරයේ ඉල්ලා සිටි බැවින් එම කාන්තාව සහ ඇයගේ විවාහක දියණිය ඇයට දරුණු ලෙස පහර දී රන්බඩු සොරකම් කිරීමේ චෝදනාව මත පොලීසියට භාරදෙන ලදී. එම චෝදනාව මත අධිකරණයට ඉදිරිපත් කල පසුව ඇය සිදු වූ අඩනේත්ට්ටම් සහ වසර පහක් පුරාවට සිදුකල දරුණු සහ කෲර වදහිංසා පිළිබඳව සිරුරේ තිබූ පිලිස්සීම් තුවාල, සීරීම් සහ කැලැල් ඇසුරෙන් පෙන්වා දී ඇත. බඳට කොසු මිටෙන් පහර දීම නිසා සිදුවූ අධික රුධිර වහනය හේතුවෙන් පොලිස් නිලධාරිනිය අධිකරණ අවසරය මත ඇය රෝහල් ගත කල අතර ඇයට සිදුකල සැත්කමකින් ගර්භාෂය ඉවත් කරන ලදී. මේ වන විට ඇය අවුරුදු පහලොවක් සම්පූර්ණ කර සිටියාය.

උක්ත සිද්ධිය පාදක කර ගෙන නූතන කම්කරු ප්‍රවණතා පිළිබඳ ක්ෂේත්‍රයේදී ඔබ ලබා ගත් දැනුම ඇසුරින් සෙනෙහෙලතාට සිදුවී ඇති වරද පිළිබඳව පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින ආයතනික ව්‍යුහය කවරේදැයි පෙන්වා දෙන්න.

(ආ) ඇය සම්බන්ධයෙන් කවර වැරදි කිනම් නීතිමය ප්‍රතිපාදන ඇසුරින් සිදුවී ඇද්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03) ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථාවන් කෙරෙහි අවධානය යොමු කරමින් සිටින දකුණු ආසියාතික වෙළඳ සංවිධානය ඒ සඳහා අප රටේ ක්‍රියාත්මක ආයතනික ව්‍යුහය පිළිබඳව ඔබගෙන් කරුණු විමසා සිටියි.

(අ) ශ්‍රම කළමනාකරණ සහයෝගීතාව (Labour Management Co-orporation) සහ කාර්මික සුහදතාව ප්‍රවර්ධනය (Industrial Harmony) වෙනුවෙන් ආයෝජන ප්‍රවර්ධන කලාප තුළ ක්‍රියාත්මක වන කාර්මික සබඳතා පිළිබඳ ප්‍රතිපත්ති, මූලධර්ම සහ නීති තත්වය කවරේදැයි එම සංගමයට පැහැදිලි කර දෙන්න.

(ආ) ශ්‍රමිකයන්ගේ සුරක්ෂාව වෙනුවෙන් අනුගමනය කිරීමට උපයෝගී කර ගනු ලබන එක්සත් ජාතීන්ගේ සංගමයේ නිර්මාණයක් වන විශ්ව එකඟතාව (Global Compact) තුළ ගැබ්වන කම්කරු ප්‍රමිතීන් පිළිබඳව ආයෝජන මණ්ඩලයේ බැඳීම පහදා දෙන්න.

(ලකුණු 20)

04) (අ) නූතන කම්කරු ප්‍රවනතා පිළිබඳ ක්ෂේත්‍රයේදී සංක්‍රමණික රැකියා පිළිබඳව රජයේ අවධානය යොමුවිය යුත්තේ මන්දැයි පැහැදිලි කරන්න?

(ආ) විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් පිටපත්ව යාමට පාදක වන හේතූන් කවරේදැයි සාකච්ඡා කරන්න.

(ඇ) සංක්‍රමණික රැකියා නියුක්තිය විධිමත් කිරීමට ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක ක්‍රමවේදයන් විස්තර කරන්න.

(ලකුණු 20)

05) කොළඹ පිහිටි ප්‍රධානතම පළාත් පාලන ආයතනයක එකතු වන කසළ බැහැර කිරීම් සඳහා එම ආයතනයේම සේවකයන් යොදවා සිදුකරනවා වෙනුවට මුළුමනින්ම පිටස්තර සමාගමකට පැවරීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා නූතන ශ්‍රම සැපයීම් ක්‍රියාවලියන් ඇසුරෙන් එකී පලාත් පාලන ආයතනයට උපයෝගී කර ගත හැකි ක්‍රමවේදයන් කවරේදැයි සවිස්තර ලෙස පැහැදිලි කරන්න. ඔබගේ විග්‍රහයේදී කම්කරු නීතිවල අදාලත්වය සහ ඒවා මග හැරීමට අවස්ථා එකී ක්‍රමවේදයන් තුළ පවතින්නේ දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 20)

06) (අ) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොලේ දැකිය හැකි නව්‍යතා සැකවින් විස්තර කරන්න.

(ආ) ග්‍රාමීය කෘෂි ආර්ථිකය සම්බන්ධව ශ්‍රම බලකායේ හැසිරීම් හා එහි ලක්ෂණ පිළිබඳ පැහැදිලි විග්‍රහයක් සිදු කරන්න

(ලකුණු 20)

07) (අ) ශ්‍රම වෙළඳපල මූලික කර සිදුවන හිංසනය හා එම හිංසනය සිදුවිය හැකි ආකාරයන් විස්තර සහිතව දක්වන්න.

(ආ) ලිංගික හිංසනය වැළැක්වීමට අදාල ක්‍රියාමාර්ග උදාහරණ සහිතව ඉදිරිපත් කරන්න

(ලකුණු 20)

08) (අ) සේවකයන්ගේ ආරක්ෂණය හා සෞඛ්‍යයට අදාලව වර්තමානයේ පවතින ගැටළු හඳුන්වා දෙන්න.

(ආ) සේවක ආරක්ෂණය සම්බන්ධයන් වන යෝජනා ඔබ ආයතනය මූලික කරගෙන ඉදිරිපත් කරන්න.

( ලකුණු 20)